# සිංහල

## 4 ශ්‍රේණිය




e-තක්සලාව
Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# 17 පාඩම - අල්පප්‍රාණ අක්ෂර සහ මහප්‍රාණ අක්ෂර හඳුනා ගනිමු.

ක්‍රියාකාරකම 1

**පියවර 1**

- පළමුවන පේළියේ හා දෙවන පේළියේ අක්ෂර කියවමු.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අල්පප්‍රාණ අක්ෂර | ක | ග | ච | ජ | ට | ඩ | ත | ද | ප | බ |
| මහප්‍රාණ අක්ෂර | ඛ | ඝ | ඡ | ඣ | ඨ | ඪ | ථ | ධ | ඵ | භ |

- පළමු පේළිය කියවීමේ දී පහසුවෙන් කියවීමට හැකිවුණා නේද?
- දෙවන පේළිය කියවීමේ දී වෙහෙසක් දැනුණා ද ?
- සිංහල හෝඩියේ මෙම අක්ෂර 10 ක් තිබෙනවා.

**පියවර 2**

- පහත අල්පප්‍රාණ අක්ෂරවලට අයත් වන මහප්‍රාණ අක්ෂර නිල් ඉරකින් යා කරමු.

| අල්පප්‍රාණ අක්ෂර | මහප්‍රාණ අක්ෂර |
|---|---|
| ක | භ |
| ග | ඵ |
| ච | ධ |
| ජ | ථ |
| ට | ඨ |
| ඩ | ඪ |
| ත | ඣ |
| ද | ඡ |
| ප | ඝ |
| බ | ඛ |

පියවර 3

- අපි දැන් තරගයක් පවත්වමු.

➢ සුදුසු ලෙසින් කණ්ඩායම් දෙකකට බෙදෙමු.

➢ එක් කණ්ඩායමක් ඉහත අල්පප්‍රාණ අක්ෂරය කියවීමේ දී එයට අදාළ මහප්‍රාණ අක්ෂරය අනෙක් කණ්ඩායම විසින් කිව යුතුයි.

➢ නිවැරදි අක්ෂරය කියූ විට ලකුණු 10 ක් ලැබේ.

➢ කණ්ඩායම මාරුවෙන් මාරුවට තරගය පවත්වමු.

➢ තම කණ්ඩායමට වැඩි ලකුණු ලබා ගැනීමට නම් අක්ෂර නිවැරදිව හඳුනාගත යුතු බව තේරුණා නේද?

